# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## Police Media Division

තැ.පෙ. අංකය / த.பெ.இ / P.O. Box No — 517

ෆැක්ස් / தொலை நகல் / Fax — 011-2329500

දුරකථනය / தொலைபேசி / Telephone — 011-2384024, 011-2395605

වෙබ් ලිපිනය / இணைய தளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E mail — dir.media@police.lk


මගේ අංකය / எனது இல / My No — 542 / 2023

ඔබේ අංකය / உமது இல / Your No —

දිනය / திகதி / Date — 2023.05.04 පැය 1530

**මාධ්‍ය නිවේදනය**

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**වෙසක් සැමරුම් උත්සවය වෙනුවෙන් කොළඹ නගරය ආශ්‍රිතව ක්‍රියාත්මක කරන රථවාහන සැලැස්මට අනුව රථවාහන ගාල් කිරීම සම්බන්ධව.**

2023 වෙසක් සැමරුම් උත්සවය වෙනුවෙන් කොළඹ නගරය කේන්ද්‍ර කර ගනිමින් බෞද්ධාලෝක වෙසක් කලාපය, බුද්ධ රශ්මි වෙසක් කලාපය ඇතුළු තවත් විවිධ වෙසක් සැමරුම් උත්සව පැවැත්වීමට අදාලව කොළඹ රථවාහන කොට්ඨාසය මඟින් විශේෂ රථවාහන සැලැස්මක් ක්‍රියාත්මක කරනු ලබයි.

එම රථවාහන සැලැස්මට අනුව ඉහත වෙසක් කලාප වලට පැමිණෙන මහජනතාවගේ පහසුව උදෙසා රථවාහන ගාල් කිරීම සඳහා නම් කරන ලද විශේෂ ස්ථාන කිහිපයක් සම්බන්ධයෙන් කොළඹ රථවාහන කොට්ඨාසය මඟින් දැනුම් දී ඇත.

**එම ස්ථාන පහත පරිදි වේ.**

- ගංගාරාම බුද්ධ රශ්මි වෙසක් කලාපයට අයත් රථ ගාල්
  - යුනියන් පෙදෙස කොම්පඤ්ඤ වීදිය හන්දියේ සිට ඉබ්බන්වල හන්දිය දක්වා
  - ධර්මපාල මාවත, හුණුපිටිය හරස් පාර සිට එෆ්.ආර්. සේනානායක මාවත දක්වා
  - එෆ්.ආර්. සේනානායක මාවත, ධර්මපාල මාවත සිට කන්නංගර මාවත දක්වා
  - වොක්ෂෝල් වීදිය
- බෞද්ධාලෝක වෙසක් කලාපයට අයත් රථ ගාල්
  - මේට්ලන්ඩ් පෙදෙස රථගාල
  - නිදහස් මාවත

- විද්‍යා මාවත
- සරණ පාර
- ආර්.ජී. සේනානායක මාවත

## ගාළු මුවදොර ප්‍රදේශය ආශ්‍රිත රථගාල

- MOD රථගාල (පැරණි ආරක්ෂක අමාත්‍යාංශය තිබූ භූමිය)

මීට අමතරව බෞද්ධාලෝක වෙසක් කලාපය වෙත පැමිණෙන රථවාහන ප්‍රමාණය අධික වූ විට කනත්ත වට රවුමෙන් පමණක් වාහන ඇතුල් කර තුම්මුල්ල හන්දියෙන් පිට කිරීමට කටයුතු කරන අතර තුම්මුල්ල හන්දිය දෙසින් රථවාහන ඇතුල් කිරීම සිදු නොකරනු ලබයි.

රථවාහන ගාල් කරනු ලබන ස්ථානවලට පරිබාහිරව පදික වේදිකාවෙහි, ප්‍රධාන මාර්ගවල හෝ අතුරු මාර්ග වල රථවාහන ගමනාගමනයට හා පැමිණෙන මහජනතාවට අවහිර වන අයුරින් රථවාහන නැවතීම හා නවතා තැබීම නොකළ යුතුවන අතර එසේ අක්‍රමවත් ලෙස ගාල් කර ඇති රථවාහන ඉවත් කිරීමට පොලිසිය මගින් කටයුතු කරන අතර, පසුව ඒ සඳහා වන මුදල් ගෙවීමට හා ඉදිරි නීතිමය ක්‍රියාමාර්ග වලට මුහුණදීමට සිදු වන බවටද පොලිසිය රියදුරන් වෙත දන්වා සිටි.

රථගාල් පිහිටා තිබෙන ස්ථාන දැක්වෙන සිතියම් 03 ක් මේ සමඟ ඔබ වෙත යොමු කරමි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය,**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**